**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**

# ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## උරුමය, ඔරොත්තු දීමේ හැකියාව, අන්තර්කරණය සහ අගය පදනම් කරගත් රැකියා සඳහා වූ සංචාරක (THRIVE) ව්‍යාපෘතිය

**ව්‍යාපෘති සම්පාදන ප්‍රදාන පහසුකම (GFPP) - ප්‍රදාන අංකය : E572-LK**

# ඇබෑර්තු

උරුමය, ඔරොත්තු දීමේ හැකියාව, අන්තර්කරණය සහ අගය පදනම් කරගත් රැකියා සඳහා වූ සංචාරක (THRIVE) ව්‍යාපෘතිය යනු ලෝක බැංකු අරමුදල් මගින් ක්‍රියාත්මක වන, වැඩිදියුණු කළ ආයතනික ධාරිතාව, තිරසාර සංචාරක ව්‍යාපාරය, උරුම සංරක්ෂණය, ඔරොත්තු දීමේ හැකියාව, සමාජීය අන්තර්කරණය සහ රැකියා උත්පාදනය තුළින් ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රය බලගැන්වීම අරමුණු කරගත් වැඩසටහනකි. ව්‍යාපෘති සම්පාදන ප්‍රදන පහසුකම (GFPP), ප්‍රදන අංක E572-LK යටතේ, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය (සංචාරක අංශය) විසින්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2026.03.28 දිනැති අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර (පූර්ණ කාලීන)

**ප්‍රධාන කාර්යයන් සහ වගකීම්**

නියමිත කාලරාමුව තුළ අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා ව්‍යාපෘති කටයුතුවලට නායකත්වය දීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වගකිව යුතුය.

**සුදුසුකම් (පහත 1 හෝ 2):**

2026.03.28 දිනැති අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව, අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය:

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

**සහ**

සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රවල පශ්චාත් උපාධියක් (Master's) හෝ වෙනත් අදාළ උපාධියක් / අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීය සුදුසුකමක්

**සමඟ**

අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, එයින් වසර 04 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පැවතිය යුතුය.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික / අධි සාමාජිකත්වය

**සමඟ**

අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, එයින් වසර 03 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පැවතිය යුතුය.

**වේතනය:**

මසකට රු. 330,000/- සහ රජය විසින් අනුමත කරන ලද දීමනා

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (MSD) විසින් නිකුත් කරන ලද, 2026.03.28 දිනැති අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට අනුකූලව රජය විසින් අනුමත කරන ලද සියලුම දීමනාවලට ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර හිමිකම් ලබයි.

**වයස**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 64 ට නොවැඩි විය යුතුය.

ප්‍රමුඛතාවය හිමිවන අතිරේක පළපුරුද්ද / විශේෂ සුදුසුකම් :

පහත සඳහන් සුදුසුකම් සහිත අය සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ:

- සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය, ආයතනික ශක්තිමත් කිරීම, ප්‍රතිපත්ති විශ්ලේෂණය, ආයතනික
- ධාරිතා වර්ධනය හෝ උපායමාර්ගික ක්‍රමසම්පාදනය පිළිබඳ ඔප්පු කරන ලද පළපුරුද්ද.
- ජාතික සහ පළාත් මට්ටමේ සංචාරක ක්‍රමසම්පාදනය සහ සංවර්ධනය සමඟ සෘජුව වැඩ කිරීමේ ප්‍රායෝගික පළපුරුද්ද.
- සංචාරක ක්ෂේත්‍රයේ ආයතන, ප්‍රතිපත්ති රාමු සහ නියාමන පරිසරය පිළිබඳ මනා අවබෝධය.
- විදේශ ආධාර ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ පළපුරුද්ද.
- හිමිකම් සහ ගෙවීම් සමාලෝචනය , ප්‍රතිචාර සූදානම් කිරීම සහ ගිවිසුම්ගත ප්‍රතිපාදන අර්ථ නිරූපණය කිරීම ආදියෙහි නිපුණතාවය.
- Microsoft Office පැකේජ, MS Project හෝ ඊට සමාන ව්‍යාපෘති කළමනාකරණ මෘදුකාංග පිළිබඳ දැනුම.

**සාමාන්‍ය තොරතුරු**

සේවකයා වේතනයෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, සේවායෝජකයා වේතනයෙන් 12% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ 3% ක් සේවක භාරකාර අරමුදලට (ETF) දායක වේ.

**සේවා කොන්දේසි**

ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා 2027.02.27 දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

**සේවා ස්ථානය:**

**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**ක්‍රමසම්පාදන අංශය (සංචාරක අංශය),**
**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය,**
**පළමු මහල, අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල,**
**බ්‍රිස්ටල් වීදිය (සර් රසීක් ෆරීඩ් මාවත), කොළඹ 01 .**

**අයදුම් කිරීම :**

ජීව දත්ත සටහන, සහතික කළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර සහිත අයදුම්පත්, 2026 සැප්තැම්බර් 22 දිනට හෝ ඊට පෙර "ව්‍යාපෘති ගණකාධිකාරී, GFPP ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU), විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය (සංචාරක අංශය), අංක 03, පැරණි ටයිම්ස් ගොඩනැගිල්ල, සර් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය), කොළඹ 01" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලිපි කවරයේ ඉහළ වම් පස කෙළවරේ "Application for Project Director (GFPP)" ලෙස සඳහන් කළ යුතුය. සහතිකපත්වල පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය.

රාජ්‍ය / අර්ධ රාජ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.

අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සපුරාලන කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**ලේකම්**
**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**
**දිනය : 2026.09.07**

Gazette.lk